අලි මිනිස් ගැටුමට විකල්ප විසඳුමක්

අනාසිමත් කාලයක සිට අලි ඇතුන් ශ්‍රී ලාංකිය ජනජීවිතය සමඟ ආගමිකව, සංස්කෘතිකව හා දේශපාලනිකව බැඳී පවති. නාලාගිරි දමනය, වුල්ලහත්ථි පදොපම සූත්‍රය වැනි බුදුසමයේ ඇතැම් සංසිද්ධීන් හා සංකල්ම අලිඇතුන් වටා ගෙති පැවතුන අතර සිව්රඟ සේනාවන්ගෙන් එකක් වූයේ හස්ති සේනාංකයයි. හිලෑ අලි ඇතුන් නොයෙකුත් කාර්යය සඳහා යෙදවුනු අතර, පුරාණ ශ්‍රී ලංකාව අලි ඇතුක් වෙළඳාමේ කේන්ද්‍රස්ථානයක් විය. අලිඇතුන් පෞඪත්වයේ සංකේතයක් සේ සැලකුණු අතර, දැනුදු ආගමික හා සංස්කෘතිමය උත්සව අලංකාර වනුයේ අලි ඇතුන්ගේ සහභාගිත්වයෙනි. අතිතයේ හීලෑ අලි ගණනය ඉතා උසස් මටටමක පැවතුණු අතර අලින්ගේ පැවැත්ම ද ඉතා සුරක්ෂිත එකක් විය.

මෙලෙස පැවති අලි - මිනිස් සහජිවනයට කණ කොකා හැඩුණේ මේ සිය වසෙහි මැද බාගය පටන්ය. වියලි කලාපිය වනාන්තරගොවිබිම් බවට පත්වීමත් සමඟම, වල් අලින්ට ඔවුන්ගේ නිජ බිම අහිමි වන්නට පටන්ගන්නට විය. ඊළඟ දශක කිහිපය තුල වියලි කළාපයේ ජනගහණ පිඩනය, අලින්ගේ නිජබිම කෙරෙහි මහත් බලපෑමක් ඇති කලේය. වඩාත්ම අභිලාෂශිලි ව්‍යාපෘතිය වූයේ කඩිනම් මහවැලි ව්‍යාපාරයයි. නිජබිම අහිමිවූ අලින්, අසළ වගා බිම් කෙරෙහි ඇදී ඒම සුලභ සිදුවීමක් බවට පත් වන්නට විය. පසුගිය දශක පහ තුල ශ්‍රී ලංකාවේ ජනගහනය තෙගුණයකින් වර්ධනය වූ අතර වනාන්තර ප්‍රමාණය හරි අඩකටත් වඩා අඩු විය. වඩාත්ම සීමාකාරී කරුණ වූයේ වනාන්තර කුඩාකැබලි වලට කැඩීම හේතුවෙන් අලි ඇතුන් ඒවාතුල කොටුවීමය. අලින්ගේ සම්ප්‍රදායික මංකඩවල්ද මිනිසුන් විසින් නොසළකන ලදී. මෙවන් තත්වයක් යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් අලි - මිනිස් ගැටුම ගැන වාර්තා වන්නට පටන්ගත් අතර එය මේ වන විට ඉතා උච්ච ස්ථානයක පවති.

ඇතැම් විට ලෝකයේ අලි - මිනිස් ගැටුමේ ත්‍රිව්‍ර තම ස්ථානය ශ්‍රී ලංකාව විය හැකිය. ආසියාවේ ඇතැම් රට වලින් සහ අප්‍රිකානු රටවලින් අලි - මිනිස් ගැටුම ගැන වාර්තා වුවද භූමි ප්‍රමානය ජනගහනය හා අලි සංඛ්‍යාව හා සසඳන කල මෙරට එය ඉතාම ඉහලය. දළ වශයෙන් වාර්ෂිකව අලි ඇතුන් 160ක් පමණ ගැටුම් නිසා ජිවිතක්ෂයට පත්වන අතර ශ්‍රී ලංකාවේ අලි ගහනය (3500 - 4000) හා සසඳන කල එය ඉතා ඉහල අගයකි. අනෙක් අතට මිලියන 19.5ක ජනගහනයෙන් දළ වශයෙන් මිනිසුන් 60ක් පමණ මියයෑමද ඉහල අනුපාතයකි.

වනාන්තර විනාශය, අලි - මිනිස් ගැටුමට ප්‍රධාන හේතුව වුවද එයට බලපාන වෙනත් හේතු සාදක ගණනාවක්ම ඇත. වනාන්තර තුළ ආහාර අඩුවීම එක් හේතුවකි. හේන් ගොවිතැන් කිරීම අඩුවීම මෙන්ම එහි චක්‍රිය කාලය අඩුවීමද ඊට බලපායි. වනාන්තර ආසන්නයේ පිහිටි කුඩා වැව් බොහෝවිට ගම්මුන්ගේ සීමාවට අයත් කරගෙන ඇති අතර ජලය පානයට පැමිණෙන අලින්, අසල ගොවි බිම් වල භෝග අනුභවයටද පුරුදු වීමද තවත් කරුණකි. ඇතැම් ජනාවාස පිහිටා ඇත්තේ අලින්ගේ සම්ප්‍රදායික මංකඩවල් අහුරා ලමිනි. වනාන්තර තුල ආහාර අඩුවීමට යාබද ගම්මානවල වැසියන් සිය ගවයින් වනාන්තර තුලට මුදාහැරීම ද බලපා තිබේ. ඇතැම් ප්‍රදේශවල අලි ගහනය අධිකවීමට උතුරු නැගෙණහිර යුද්ධද බලපා ඇත. අලි - මිනිස් ගැටුමට බලපාන ප්‍රාදේශිය කරුණ, විශේෂිත පරිසර තත්ව යටතේද හඳුනාගත හැකිය.

අලි - මිනිස් ගැටුම උග්‍ර වන විට රජය මෙන්ම ගැමියන්ද විවිධ ක්‍රමෝපාය යොදාගන්නට පටන්ගන්නට විය. මේවා අතර සම්ප්‍රදායික ක්‍රම මෙන්ම වන ජිවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරණ ලද පාලණ ක්‍රමද වේ. ගැමියන් විසින් භාවිත කරණ පැල් රැකීම ගිනි මෙලවීම හා රතිඥ පත්තු කිරීම හුදෙක් අලි එලවීම සඳහා පමණක් ප්‍රතිඵල දායක වන අතර වන ජිවී දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරණ ක්‍රමෝපායයන් ඉහළ පිරිවැයක් සහිත සංකිර්ණ ඒවාවේ. දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරණ අලි රංචු වශයෙන් සංරක්ෂිත ප්‍රදේශ කරා පලවා හැරීම දරුණු අලින් රක්ෂිත භූමි කරා විදුලි වැටවල් ද ඒ අතරවේ.

අලි - මිනිස් ගැටුම බහුල ප්‍රසේශ වල, එලවීමේ මෙහෙයුම් ගනනාවක්ම පසුගිය දශක දෙක තුල, වනජිවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරණ ලදී. එහෙත් දත්ත වාර්තා පෙන්වා දෙන පරිදි එම අලින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් නැවත පෙර ස්ථානයට පැමිණ තිබේ. දරුණු අලින නිර්වින්දනය කර, රක්ෂිත භූමි තුලට යම් ප්‍රමාණයකට සාර්තක වුවද, වෙනත් අලින් දඩබ්බරයන් බවට පත්වීම වැලකිය නොහැක. බහුලව යොදා ඇති සාර්තක උපක්‍රමයක්සේ සැලකෙන විදුලිවැටවල් වනරක්ෂිත හා ගම්මාන අතර භෞතික මායිමකි. මේ සඳහා සැලකියයුතු ප්‍රාග් ධනයක් අවශ්‍ය වන අතර, මේවනවිට සවිකර ඇති විදුලි වැටවල් වලින් සමහරක් ක්‍රියා විරහිතවී ඇත. අප විසින් කරණ ලද සමික්ෂණයකදී පැහැදිලිවුයේ විදුලිවැට වලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබෙන බවය. විදුලි වැට වලින් අවශ්‍ය ආරක්ෂාව ලැබෙන විට, ඒවායේ නඩත්තුව ගැන නොසලකා හැරීමට ඇතැම් ගම්මුන් පුරුදුවී ඇත. ප්‍රජා සහභාගිත්වයෙන් එහි නඩත්තු ඉටු නොවන විට මෙන්ම සූර්ය කෝෂ නිසි පරිදි නොයෙදීම නිසාද එහි නිසි ප්‍රතිඵල නොලැබීගොස් ඇත. තම ගවයන් වනාන්තරයට ඇතුලු කිරීමට ගම්මු විසින් විදුලි වැටවල් කඩා දැමු අවස්ථා ද තිබේ. විදුලි වැට නිසාඅලි, අනිකුත් ගම්මානවල ගැටුම් උග්‍රවු සිද්ධීන් ද තිබේ. මෙයට හේතුව මනා භූමි පරිශිලන සැලැස්මකින් තොරව විදුලි වැටවල් ඉදිකිරීමය. පර්යේෂකයන් පෙන්වා දෙන්නේ, විධිමත් සැලැස්මක් නොමැතිව මෙවැනි ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කර ඇති අතර, ගැටුමට මුලික හේතු සාධක ගැන මීටවඩා අවධානයක් යොමු කල යුතු බවය. මෑතකදී අප විසින් කරන ලද අධ්‍යයනයකින් හෙලිවූයේ බොහෝ ගැමියන් තවමත් සම්ප්‍රදායානුකුල විශ්වාසය තබා ඇති බවයි. මෙම සියලු ක්‍රමෝපායවල අසාර්තකත්වය පිළිඹිබුවන්නේ දිවයිනේ විවිද ප්‍රදේශවලින් වාර්තාවන අලි - මිනිස් ගැටුමට අදාල සිද්ධීන් "මිනිස් හා අලි මරණ, වගා හා දේපල හානි" සංඛ්‍යාව දිනෙන්දින ඉහල යැම තුලිනි.

ඇත්තෙන්ම මෙරට වල් අලි ගහනයෙන් අඩකටත් වඩා ජිවත් වන්නේ සංරක්ෂිත ප්‍රදේශ වලින් බැහැරවය. මෙම අලින් බොහෝ විට ලඳු කැලෑවල වසරේ විවිධ කාලවලදී අනෙකුත් ලඳු කැලෑ කරා සංක්‍රමණය කරති. මෙවැනි තත්වයන්තුල අසල ගොවි බිම් වලට කඩාවැදීම වැලැක්විය නොහැක. මින් පසක් වන්නේ අලි - මිනිස් ගැටුම සපුරා නිරාකරණය කිරීම යථාර්තය නොවන බවය. මෙහිදී වඩාත්ම වැදගත් වන්නේ මෙම ගොවි බම් වල වෙසෙන ජනයා ගැටුමේ ප්‍රධාන පාර්ශව කරුවන් ලෙස හඳුනා නොගෙන කරණ කිසිදු ක්‍රමෝපායකින් සාර්ථක ප්‍රතිඵල නොලැබෙන බවයි. මෙම ගම්මානවල වැසියන්ගෙන් නිසි සහයෝගය ලබානොගෙන ගැටළුවට අවශ්‍ය විසඳුම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල නොහැක. නිබඳවම සිදුවන වල් අලි හානි මගින් ඔවුනගේ බෝග විනාශ වීම හා ඔවුනගේ දුගිබව අතර ඍජු සම්බන්ධතාවයක් ඇතිබව නෙදර්ලන්තයේ ෆි සරසවිය හා පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ කෘෂි විද්‍යා පිඨය මගින් කරණ ලද අධ්‍යයනයකින් තහවුරු විය. මින් පසක් වන්නේ ඔවුන්ගේ දුගි බවට පිළියම් යෙදීමද ගැටුමට අවශ්‍ය විසඳුමේ කොටසක් විය යුතු බවය.

මාධ්‍ය මගින් හුවා දක්වන අලි හෝ මිනිස් මරණ මෙම ගැටුමේ ත්‍රිව්‍ර අවස්ථාව වුවද, මෙම ගොවි ජනයා වඩාත්ම පීඩාවට පත්වන්නේ බෝගහානි කරණ කොටගෙනය. මේ පිළිබඳව සංඛ්‍යා ලේඛණ නොමැත්තේ අදාල වන්දි සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවට ගොවීන් පැමිණිලි නොකරන බැවිනි. මෙයට හේතුව යාන්ත්‍රනයේ ඇති කාර්යක්ෂමතාවයයි. අනෙක් අතට අලින්ගේ නිරන්තර සංසරනය නිසා මෙම ප්‍රදේශ වල මිනිසුන්ගේ ඇති භීතිය හා අවධානමද මේ පිළිබඳව තීරන ගන්නා අයගේ අවධානයට යොමුවී නැත. මිනිසුන් වැඩට නොයෑම, දරුවන් පාසැලට/පන්තිවලට නොයෑම රාත්‍රියට ගමන් බිමන් වල අපහසුව සහ වගා බිම් ආරක්ෂා කිරීමට සිදුවීම වැනි වක්‍ර ආකාරයේ පිරිවැය මීට අයත්වේ.

අලින් විසින් කරණු ලබන විවිධා කාරයේ හානි වලට සාධාරණ වන්දියක් ලැබේ නම් “ වෙසෙසින්ම වගා හානි වලට” මිනිසුන් අලින්ට හානි කිරීමට පෙළඹීම අඩු වීමට ඉඩ තිබේ. අනෙක් අතට එය බෝග හානිය කරණ කොට ගෙන ඇතිවී තිබෙන ග්‍රාමීය දුගී බව තුරන් කිරීමට හේතුවනු ඇත. දිවයිනේ අලි - මිනිස් ගැටුමට ප්‍රාත්‍ර වන පවුල් 250000ක් පමණ වන අතර, විවිධ ආකාරයේ අලි හානි සඳහා වන්දිගෙවීමට රජයකට කිසිසේත්ම ඔරොත්තු දෙන්නේ නැත.

එබැවින් කලයුත්තේ කුමක් ද? මෙරට අලි මිනිස් ගැටුමෙන් පීඩාවට පතවන ග්‍රාමීය ජනයා මෙන්ම, අලි සංරක්ෂණය සඳහා දැඩි උනන්දුවක් දක්වන නාගරික / අර්ධ නාගරික ජන සමූහයක් ද සිටිති. අධ්‍යයන වලින් පෙනී ගියේ නාගරික ජනතාවගේ සාමුහික ගෙවීමේ කැමැත්ත, වගා හානිය පියවීමට ප්‍රමාණවත් බවය. එය එසේ නම් අවශ්‍ය වන්නේ මුල්‍ය හුවමාරු යාන්ත්‍රනයකි. එනම් අර මුදලක් පිහිටුවා එමගින් රක්ෂනයක් ක්‍රියාත්මක කිරීමය.

මේ වන විටද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ජීවිත හා අනතුරු සඳහා වන්දි ගෙවීමේ ක්‍රමයක් පවතින නමුදු එය ඉතා අකාර්යක්ෂම මට්ටමක පවතී. වගා හානි සම්බන්ධයෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් වන්දි ලබා ගත හැකි වුවද පවතින අකාර්යක්ෂමතාව නිසා ගොවීන් බහුතරයක් ඒ සඳහා ඉල්ලුම් නොකරති. මෙම වන්දි මුදල් ප්‍රමාණය වගා හානිය හා සසඳන විට ඉතා අල්ප වීමද වන්දි නොඉල්ලීමට තවත් හේතුවකි. වඩාත් ප්‍රායෝගික ක්‍රියාවලියක් සඳහා රක්ෂිතයාගෙන්ද දායකත්වයක් අවශ්‍ය අතර එය වෙළඳපොල ආර්තික ක්‍රමය තුල ක්‍රියාත්මක කළහැකිවිය යුතුය. එනම් පෞද්ගලික රක්ෂණ සමාගම් මෙයට පිවිසීම තුලින් කාර්යක්ෂමතාව සුරක්ෂිත කලහැකිය. ගැටළුව වන්නේ ගොවීන් හට· දැරිය හැකි වාරික මුදල ඉතා අඩු අගයක් වීමත් ඔවුන් අපේක්ෂිත ප්‍රතිලාබ සඳහා රක්ෂණ සමාගම් විසින් අය කල යුතු වාරික මුදල සැලකිය යුතු තරම් ඉහල වීමත්ය.

අප විසින් දිවයිනේ විවිධ ප්‍රදේශ වලදී කරණ ලද ක්ෂේත්‍ර අධ්‍යයන වලින් පෙනිගියේ අලි හානි නිසා වන මරණයක් සඳහා රු. 200,000 ක්, වගා හානි සඳහා රු. 20000/= ක් ආදි වශයෙන් ගැමියන් අපේක්ෂා කරණ ප්‍රතිලාබ සඳහා ගෙවිය හැකි වාර්ෂික රක්ෂ වාරිකය රු. 150/= වන බවය. එහෙත් මේ සඳහා රක්ෂණ සමාගම් වල ගණනය අනුව රු 750/=ක වාර්ෂික වාරිකයක් අවශ්‍ය වේ. මෙම වෙනස පියවා ගැනිමට අප මුලින් සඳහන් කරණ ලද අරමුදල උපයෝගි කරගත හැකිය. මෙමගින් නාගරික ඉහළ ආදායම් ලබන ජනතාව අධි සංරක්ෂණයට දායක වන අතර, වඩා කාර්යක්ෂම යාන්ත්‍රනයක් මගින් අලි හානි නිසා සිදුවන හානි වලට වන්දි ලැබේ. මෙවන් සංකල්පයන් වඩාත් සමාජ සාධාරනය වන්නේ මෙරට සුපිරි හා මධ්‍යම පන්තිය ජාතික ආදායම්න් අසාමානු පාතික කොටසක් පරිභෝජනය කරන බැවින් ග්‍රාමීය දුගි භාවය 25%ක් තරම් ඉහල මට්ටමක පවතින බැවිනුත් නිසාවෙනි. දේශිය මෙන් විදේශිය පරිසර සංවිධානවල සහයෝගයද, මෙම අරමුදලට ලබා හත හැකි අතර විධිමත් යාන්ත්‍රනයක් තුලින් මෙම මුල්‍ය හුවමාරුව අධික්ෂන කල හැකිය.

මෙවන් වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කිරීමේසි විවිධ ප්‍රායෝගික අපහසුතා පැණනැගිය හැකිය. ගැමියන් ව්‍යාජ වන්දි ඉල්ලීම් ඉදිරිපත් කිරීම, හානි අධි තක්සේරු කිරීම, සහ වන්දි ලබාගත් පසු වාරික ගෙවිම අත්හිටුවිම ඒ අතර වේ. ප්‍රජාමුල සංවිධාන වලට ඇතැම් කටයුතු පැවරීමෙන් සහ ග්‍රාමීය නිලධාරීන් සහභාගි කරවා ගැනිමෙන් ඇතැම් ක්ෂේත්‍ර ගැටළු මග හරවා ගත හැක. පෞද්ගලික රක්ෂණ සමාගම් වල මැදිහත්විම කාර්යක්ෂමතාව ඉහල නංවයි.

අවසාන වශයෙන් සඳහන් කල හැක්කේ මෙවන් රක්ෂණාවරණයකින් පමණක් අලි - මිනිස් ගැටුම නිරාකරණය කල නොහැකි බවය. එහෙත් එය මෙම ගැටුමෙන් අප්‍රමාණව පිඩා විඳින දස දහස් ගනන් දුගි ජනතාවගේ ජිවන ගැටළු සමනය කෙරෙන අතර එමගින් ඔවුන් තුල අලි - ඇතුන් කෙරෙහි සහජිවනයක් ජනිත කරවනු ඇත. අලි - මිනිස් ගැටුමේ ප්‍රධාන කොටස් කාරයන් මෙම ගැමියනි වන බැවින් එය සංරක්ෂණයේ සැ බෑ ප්‍රතිඵල ලගා කර ගැනිමට පාදක වනු ඇත.

ආචාර්යය එල් එච් පි ගුණරත්න
කෘෂි විද්‍යා පිඨය
පේරාදෙනිය විශ්ව විද්‍යාලය.